1978 - 7 - 20

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 26

# දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 3 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 ජූලි මස 07 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 55 යි. තැපැල් ගාස්තුව : ශත 15 යි

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 26 දරන
මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 3 වන දින]

එල්. ඩී.—ඕ. 14/78.

**1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 26 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1971 අංක 55 දරන පනතින් අන්තිම වරට සංශෝධනය කරන ලද (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 11 දරන මුදල් පනතේ 120 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 1963 අංක 11 දරන පනතේ 120 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ කරගෙන යනු ලබන කවර වුව ද ව්‍යාපාරයක් සම්බන්ධයෙන්,—

(අ) 1969 සැප්තැම්බර් මස 30 වන දිනයෙන් හෝ ඉන් පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, පහත සඳහන් අවස්ථා වල දී, එනම්,—

(i) ඒ තක්සේරු වර්ෂය ආරම්භ වූ දිනයට පෙර අවුරුද්දකට නොඅඩු කාලයක් ඒ තැනැත්තා විසින් කරගෙන ගිය ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ තක්සේරු වර්ෂයට පෙරාතුව ම වූ ගණන් බැලීමේ කාලපරිච්ඡේදය තුළ දී ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තාගේ පිරිවැටුම රුපියල් ලක්ෂයකට නොඅඩු වන්නේ නම්, හෝ

(ii) ඒ තක්සේරු වර්ෂය ආරම්භ වූ දිනයට පෙර අවුරුද්දකට අඩු කාලයක් ඒ තැනැත්තා විසින් කරගෙන ගිය ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ කාලපරිච්ඡේදය තුළ දී ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තාගේ පිරිවැටුම, ඒ කාලපරිච්ඡේදයේ දින ගණන හා තුන්සිය හැටපහක් අතර ඇති අනුපාතයට සමාන ම අනුපාත

යක් ඇති වන්නේ යම් මුදලක් හා රුපියල් ලක්ෂයක් අතර ද, ඒ මුදලට නොඅඩු වන්නේ නම්,

ඔහුගෙන් ව්‍යාපාර පිරිවැටුම් බද්ද අය කළ යුතු ය ;

(ආ) 1960 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඊළඟට එළඹෙන තක්සේරු වර්ෂය සඳහා, පහත සඳහන් අවස්ථාවල දී, එනම්,—

(i) ඒ තක්සේරු වර්ෂය ආරම්භ වූ දිනයට පෙර අවුරුද්දකට නොඅඩු කාලයක් ඒ තැනැත්තා විසින් කරගෙන ගිය ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ තක්සේරු වර්ෂයට පෙරාතු වම වූ ගණන් බැලීමේ කාලපරිච්ඡේදය තුළ දී ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තාගේ පිරිවැටුම රුපියල් හැත්තෑපන්දහසකට නොඅඩු වන්නේ නම්, හෝ

(ii) ඒ තක්සේරු වර්ෂය ආරම්භ වූ දිනයට පෙර අවුරුද්දකට අඩු කාලයක් ඒ තැනැත්තා විසින් කරගෙන ගිය ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ කාලපරිච්ඡේදය තුළ දී ඒ ව්‍යාපාරයෙන් ඒ තැනැත්තාගේ පිරිවැටුම, ඒ කාලපරිච්ඡේදයේ දින ගණන හා තුන්සියහැටපහක් අතර ඇති අනුපාතයට සමානම අනුපාතයක් ඇති වන්නේ යම් මුදලක් හා රුපියල් හැත්තෑපන්දහසක් අතර ද, ඒ මුදලට නොඅඩු වන්නේ නම්

ඔහුගෙන් ව්‍යාපාර පිරිවැටුම් බද්ද අය කළ යුතු ය ;

(ඇ) 1971 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව එහෙත් 1977 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක එක් එක් කාර්තුව සඳහා පහත සඳහන් අවස්ථාවල දී, එනම්,—

(i) ඒ තැනැත්තා විසින් ඒ ව්‍යාපාරය ඒ කාර්තුවේ මුළු කාලය තුළ දී ම කරගෙන ගිය අවස්ථාවක, ඒ කාර්තුව සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම රුපියල් දහඅටදහස් හත්සිය පනහකට නොඅඩු වන්නේ නම්, හෝ

(ii) ඒ තැනැත්තා විසින් ඒ ව්‍යාපාරයේ ඒ කාර්තුවේ කොටසක දී පමණක් කරගෙන ගිය අවස්ථාවක, ඒ කාර්තුවේ ඒ කොටස සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම ඒ කාර්තුවේ ඒ කොටසේ දින ගණන හා අනූ එකක් අතර ඇති අනුපාතයට සමාන ම අනුපාතයක් ඇති වන්නේ යම් මුදලක් හා රුපියල් දහඅටදස් හත්සිය පණහක් අතර ද, ඒ මුදලට නොඅඩු වන්නේ නම්

ඔහුගෙන් ව්‍යාපාර පිරිවැටුම් බදු අය කළ යුතු ය; තව ද,

(ඇ) 1977 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක එක් එක් කාර්තුව සඳහා, පහත සඳහන් අවස්ථාවල දී, එනම්,—

(i) ඒ තැනැත්තා විසින් ඒ ව්‍යාපාරය ඒ කාර්තුවේ මුළු කාලය තුළ දී ම කර ගෙන ගිය අවස්ථාවක දී ඒ කාර්තුව සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම රුපියල් විසිපන්දහසකට නොඅඩු වන්නේ නම්, හෝ

(ii) ඒ තැනැත්තා විසින් ඒ ව්‍යාපාරය ඒ කාර්තුවේ කොටසක දී පමණක් කර ගෙන ගිය අවස්ථාවක දී ඒ කාර්තුවේ ඒ කොටස සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම, ඒ කාර්තුවේ ඒ කොටසේ දින ගණන හා අනූඑකක් අතර ඇති අනුපාතයට සමාන ම අනුපාතයක් ඇති වන්නේ යම් මුදලක් හා රුපියල් විසිපන්දහසක් අතර ද ඒ මුදලට නොඅඩු වන්නේ නම්

ඔහුගෙන් ව්‍යාපාර පිරිවැටුම් බදු අය කළ යුතු ය.

121 වන වගන්තිය යටතේ ව්‍යතිරික්ත භාණ්ඩයක් ලෙස ප්‍රකාශිත යම් භාණ්ඩයක් විකිණීමෙන් ව්‍යාපාරයක් කර ගෙන යන්නා වූ යම් තැනැත්තකු විසින් ලබා ගන්නා ලද මුදල, (ඇ) ඡේදයේ සහ (ඇ) ඡේදයේ කාර්ය සඳහා, ඒ ව්‍යාපාරයේ පිරිවැටුමෙහි කොටසක් වන ලෙස සැලකිය යුතු ය.”; තව ද

(ආ) ඒ වගන්තියේ (1ආ) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1ආ) (අ) යම් තැනැත්තකු විසින්, 1969 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව එහෙත් 1971 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් තුළ වූ යම් දිනයක දී යම් ව්‍යාපාරයක් කරගෙන යාම ආරම්භ කළහොත් හෝ, 1969 ඔක්තෝබර් මස 1 වන දිනට පෙර ආරම්භ කරන ලද යම් ව්‍යාපාරයක් කරගෙන යාමේ දී ඒ ව්‍යාපාරය මගින් නිතිපතා බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය හෝ විකිණීම 1969 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ දී පටන් ගත හොත්, ඔහු විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරයෙන් ඒ තක්සේරු වර්ෂය තුළ දී ලැබෙන පිරිවැටුම සම්බන්ධයෙන් හෝ, යට කී පරිදි බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය හෝ විකිණීම පටන් ගන්නා ලද්දේ කවර ව්‍යාපාරයක් කරගෙන යාමේ දී ද ඒ ව්‍යාපාරයෙන් ඒ තක්සේරු වර්ෂය තුළ දී ලැබෙන පිරිවැටුම සම්බන්ධයෙන් හෝ, ඔහු විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරය නැතහොත් යට කී පරිදි බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය හෝ විකිණීම පටන් ගත් ව්‍යාපාරය ඔහු විසින් කරගෙන යනු ලබන වෙනත් යම් ව්‍යාපාරයක් සමග එකම ව්‍යාපාරයක් ලෙස මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා සලකනු ලබන අවස්ථාවක දී එසේ එක් ව්‍යාපාරයක් ලෙස සලකනු ලබන ව්‍යාපාරයෙන් ඒ තක්සේරු වර්ෂය තුළ දී ලැබෙන පිරිවැටුම සම්බන්ධයෙන් හෝ, (1) වන උපවගන්තියේ පටහැණිව කුමක් සඳහන්ව ඇත ද ඒ තැනැත්තාගෙන් ව්‍යාපාර පිරිවැටුම් බදු අය කළ යුතු ය :

එසේ වුව ද, පහත සඳහන් අවස්ථාවල දී, එනම්,—

(i) ඒ ව්‍යාපාරය ඔහු විසින් ආරම්භ කළ කාර්තුවේ දී හෝ යට කී පරිදි බඩු නැතහොත් වෙළෙඳ ද්‍රව්‍ය විකිණීම පටන් ගත් කාර්තුවේ දී හෝ ඔහු විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරයෙන් නැතහොත් යට කී පරිදි බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය හෝ විකිණීම පටන් ගත් ව්‍යාපාරයෙන් එසේත් නැතහොත් ඒ ව්‍යාපාරය සහ වෙනත් යම් ව්‍යාපාරයක් එකම ව්‍යාපාරයක් ලෙස සලකනු ලැබේ ද එසේ එක් ව්‍යාපාරයක් ලෙස සලකනු ලබන ව්‍යාපාරයෙන් ඔහු ලැබූ පිරිවැටුම, අවස්ථාවෝචිත පරිදි, ඒ ව්‍යාපාරය ආරම්භ කළ දිනයෙන් නැතහොත් යට කී

පරිදි බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය හෝ විකිණීම පටන් ගත් දිනයෙන් ආරම්භ ව ඒ කාර්තුවේ අවසාන දිනයෙන් අවසාන වන කාලපරිච්ඡේදයේ අඩංගු දින ගණන හා අනූ එකක් අතර ඇති අනුපාතයට සමාන ම අනුපාතයක් ඇති වන්නේ යම් මුදලක් හා රුපියල් දහ අටදස් හත්සිය පණහක් අතර ද ඒ මුදලට අඩු වන්නේ නම්, ඒ කාර්තුව සඳහා, හෝ

(ii) ඒ තක්සේරු වර්ෂයේ කවර වුව ද තදනන්තර කාර්තුවක පිරිවැටුම රුපියල් දහ අටදස් හත්සිය පණහකට අඩු වන්නේ නම් ඒ කාර්තුව සඳහා

ව්‍යාපාර පිරිවැටුම් බද්ද ගෙවීමට ඒ තැනැත්තා යටත් නො වන්නේ ය.

(ආ) යම් තැනැත්තකු විසින්, 1969 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව එහෙත් 1971 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ආරම්භ කරන ලද යම් ව්‍යාපාරයකින් ලැබූ පිරිවැටුම හෝ, යම් ව්‍යාපාරයක් කරගෙන යාමේ දී 1969 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂය තුළ බඩු නැතහොත් වෙළෙඳ ද්‍රව්‍ය විකිණීමෙන් ඒ තක්සේරු වර්ෂයේ දී ඒ තැනැත්තාට ලැබුණු පිරිවැටුම, ඒ ව්‍යාපාරය ආරම්භ කළ දිනයෙන් නැතහොත් ඒ බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය හෝ විකිණීම ආරම්භ කළ දිනයෙන් පටන් ගෙන ඒ තක්සේරු වර්ෂයේ අන්තිම දිනයෙන් අවසන් වන කාලපරිච්ඡේදයේ අඩංගු දින ගණන හා තුන්සිය හැටපහක් අතර ඇති අනුපාතයට සමාන ම අනුපාතයක් ඇති වන්නේ යම් මුදලක් හා රුපියල් හැත්තෑපන්දහසක් අතර ද, ඒ මුදලට වඩා අඩු වන්නේ නම්, මේ උපවගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන යටතේ ඒ තැනැත්තා විසින් ගෙවන ලද බද්ද, ඒ තක්සේරු වර්ෂය ගත වීමෙන් පසු අවුරුදු තුනක් ඇතුළත දී ඒ තැනැත්තා විසින් ඉල්ලුම් කිරීමෙන් පසු ආපසු ගෙවනු ලැබීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :—

" වාර වාර්තා.

123. (1) 1971 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව එහෙත් 1977 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවෙහි යම් ව්‍යාපාරයක් කර ගෙන යන සෑම තැනැත්තකු ම විසින්, පහත සඳහන් අවස්ථාවල දී, එනම්,—

(අ) එයින් යම් තක්සේරු වර්ෂයක යම් කාර්තුවක මුළු කාලය තුළ දී ම ඒ ව්‍යාපාරය කර ගෙන ගියේනම් සහ ඒ කාර්තුව සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම රුපියල් දහඅටදහස් හත්සිය පණහකට නොඅඩු වන්නේ නම්, හෝ

(ආ) එයින් යම් තක්සේරු වර්ෂයක යම් කාර්තුවක කොටසක දී පමණක් ඒ ව්‍යාපාරය කර ගෙන ගියේ නම් සහ ඒ කාර්තුවේ ඒ කොටස සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම, ඒ කාර්තුවේ ඒ කොටසේ දින ගණන හා අනූ එකක් අතර ඇති අනුපාතයට සමාන ම අනුපාතයක් ඇති වන්නේ යම් මුදලක් හා රුපියල් දහඅටදාස් හත්සිය පණහක් අතර ද, ඒ මුදලට වඩා නො අඩු වන්නේ නම්

ඒ කාර්තුව අවසන් වීමෙන් පසු දින පහළොවක් ඉකුත් වීමට පෙර ඒ කාර්තුව සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම දක්වමින් වාර වාර්තාවක් ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය. ඒ සෑම වාර වාර්තාවක් ම නියමිත ආකෘති පත්‍රය අනුසාරයෙන් සැපයිය යුතු අතර ඒ ආකෘති පත්‍රයෙහි ඇතුළත් කිරීමට නියමිත සියලු විස්තර එහි ඇතුළත් කළ යුතු ය.

(2) 1977 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව හෝ ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවේ දී යම් ව්‍යාපාරයක් කර ගෙන යන සෑම තැනැත්තකු ම විසින්, පහත සඳහන් අවස්ථාවල දී, එනම්,—

(අ) එයින් යම් තක්සේරු වර්ෂයක යම් කාර්තුවක මුළු කාලය තුළ දී ම ඒ ව්‍යාපාරය කර ගෙන ගියේ නම් සහ ඒ කාර්තුව සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම රුපියල් විසිපන් දහසකට නොඅඩු වන්නේ නම්, හෝ

(ආ) එසින් යම් තක්සේරු වර්ෂයක යම් කාර්තු වකින් කොටයක දී පමණක් ඒ ව්‍යාපාරය කර ගෙන ගියේ නම් සහ ඒ කාර්තුවේ ඒ කොටස සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම, ඒ කාර්තුවේ ඒ කොටසේ දින ගණන හා අනූ එකක් අතර ඇති අනුපාත යට සමාන ම අනුපාතයක් ඇති වන්නේ යම් මුදලක් හා රුපියල් විසිපන් දහසක් අතර ද ඒ මුදලට වඩා නොඅඩු වන්නේ නම්

ඒ කාර්තුව අවසන්වීමෙන් පසු දින පහළොවක් ඉකුත්වීමට පෙර ඒ කාර්තුව සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම දක්වමින් වාර වාර්තාවක් ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය. ඒ සෑම වාර වාර්තාවක් ම නියමිත ආකෘති පත්‍රයේ අනුසාරයෙන් සැපයිය යුතු අතර ඒ ආකෘති පත්‍රයෙහි ඇතුළත් කිරීමට නියමිත සියලු විස්තර එහි ඇතුළත් කළ යුතු ය. ".

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 125අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 125ආ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 125ආ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

" වාර වාර්තා වක් නොපිළි ගැනීමට හේතු තක්සේරුකරු විසින් දැක්විය යුතු බව.

125ආ. යම් තක්සේරු වර්ෂයක යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු විසින් 123 වන වගන්තිය යටතේ හෝ 126 වන වගන්තිය යටතේ හෝ සප යන ලද වාර වාර්තාවක් තක්සේරුකරුවකු විසින් නොපිළිගෙන ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා උදෙසා 124 වන වගන්තිය යටතේ හෝ 125 වන වගන්තිය යටතේ හෝ තක්සේරුවක් නැත හොත් අතිරේක තක්සේරුවක් කරනු ලබන අවස් ථාවක දී, ඒ වාර වාර්තාව නොපිළිගැනීමට තමාට ඇති හේතු ඒ තක්සේරුකරු විසින් ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. ".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 152 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 152 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (3) ව්‍යාපාරයක් කර ගෙන යන යම් තැනැත්තකු විසින්, 1971 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව එහෙත් 1977 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක එක් කාර්තුවක් හෝ එකකට වැඩි කාර්තු

ගණනක් සඳහා ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ව්‍යාපාර පිරිවැටුම් බද්ද ගෙවා ඇති අවස්ථාවක හා ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම,—

(අ) ඒ ව්‍යාපාරය ඒ තක්සේරු වර්ෂයේ සම්පූර්ණ කාලය තුළ කර ගෙන යනු ලැබූ අවස්ථාවක රුපියල් හැත්තෑපන්දහසකට අඩු නම්, හෝ

(ආ) ඒ ව්‍යාපාරය ඒ තක්සේරු වර්ෂයේ කොටසක් තුළ පමණක් කර ගෙන යන ලද අවස්ථාවක, ඔහු විසින් ඒ තක්සේරු වර්ෂයේ ඒ ව්‍යාපාරය කර ගෙන යන ලද කාලපරිච්ඡේදය ඇතුළත වූ දවස් ගණන හා තුන්සිය හැටපහ අතර ඇති අනුපාතයට සමාන ම අනුපාතයක් ඇති වන්නේ යම් මුදලක් හා රුපියල් හැත්තෑපන්දහසක් අතර ද, ඒ මුදලට අඩු වන්නේ නම්

ඒ තක්සේරු වර්ෂය ගතවීමෙන් පසු අවුරුදු තුනක් ඇතුළත ඉල්ලුම් කිරීමෙන් පසු, ඒ කාර්තුව හෝ කාර්තු සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවන ලද ව්‍යාපාර පිරිවැටුම් බද්ද ආපසු ගෙවනු ලැබීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය. "; තව ද

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (4) ව්‍යාපාරයක් කර ගෙන යන යම් තැනැත්තකු විසින්, 1977 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව හෝ ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක එක් කාර්තුවක් හෝ එකකට වැඩි කාර්තු ගණනක් සඳහා ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ව්‍යාපාර පිරිවැටුම් බද්ද ගෙවා ඇති අවස්ථාවක හා ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම,—

(අ) ඒ ව්‍යාපාරය ඒ තක්සේරු වර්ෂයේ සම්පූර්ණ කාලය තුළ කර ගෙන යනු ලැබූ අවස්ථාවක රුපියල් ලක්ෂයකට අඩු නම්, හෝ

(ආ) ඒ ව්‍යාපාරය ඒ තක්සේරු වර්ෂයේ කොටසක් තුළ පමණක් කර ගෙන යන ලද අවස්ථාවක, ඔහු විසින් ඒ තක්සේරු වර්ෂයේ ඒ ව්‍යාපාරය කර ගෙන යන ලද කාලපරිච්ඡේදය ඇතුළත වූ දවස් ගණන හා තුන්සියහැටපහ අතර ඇති අනුපාතයට සමාන ම අනුපාතයක් ඇති වන්නේ යම් මුදලක් හා රුපියල් ලක්ෂයක් අතර ද, ඒ මුදලට අඩු වන්නේ නම්

ඒ තක්සේරු වර්ෂය ගත වීමෙන් පසු අවුරුදු තුනක් ඇතුළත ඉල්ලුම් කිරීමෙන් පසු, ඒ කාර්තුව හෝ කාර්තු සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවන ලද ව්‍යාපාර පිරිවැටුම් බද්ද ආපසු ගෙවනු ලැබීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.”.

6. (ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 3 දරන පනතින් අවසන් වරට සංශෝධිත) ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි “නිෂ්පාදකයා” යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

“ “නිෂ්පාදකයා” යන්නෙන්—

(අ) භාණ්ඩයක් සාදන;

(ආ) රසායනික ක්‍රියාවලියකින් හෝ අන්‍යාකාරයකින් යම් භාණ්ඩයක් එකලස් කරන නැතහොත් සම්බන්ධ කරන;

(ඇ) යම් භාණ්ඩයක් විකිණීම පිණිස සුදුසු තත්ත්වයට සකස් කරන;

(ඈ) සිල්ලර ගබඩාවක විශේෂයෙන් ම පාරිභෝගිකයන්ට කෙළින් ම විකිණීමේ කාර්යය සඳහා එම සිල්ලර ගබඩාවෙහි නොව අන් තැනක පැකට් කිරීමෙන්, බෝතල් ගත කිරීමෙන්, පෙට්ටිවල ඇසිරීමෙන්, කෑලි වලට කැපීමෙන්, පිරිසිදු කිරීමෙන්, ඔප දැමීමෙන්, එතීමෙන්, ලේබල් ඇලවීමෙන් නැතහොත් කවර වූ හෝ වෙනත් යම් ආකාරයකින් යම් භාණ්ඩයක් විකිණීම සඳහා පිළියෙළ කරන;

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 17 වන වගන්තිය යටතේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව විසින් ගිවිසුමකට එළඹ ඇත්තේ යම් ව්‍යාපාරයක් සමඟ ද ඒ ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදිත යම් භාණ්ඩයක් මිලට ගන්නා

යම් තැනැත්තෙක් අදහස් වේ;”.